Gmail CSR RTI <csr.rti281@gmail.com>

---

**RTI/CSR/ 0068 - තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 25 (3) වගන්තිය යටතේ පැය 48ක් තුළ ප්‍රතිචාර දැක්විය යුතු තොරතුරු ඉල්ලීමකට අදාළ අභියාචනයකි.**

1 message

---

**CSR RTI** <csr.rti281@gmail.com> 20 July 2022 at 13:54
To: igp@police.lk, dig.staff@police.lk
Cc: Tharindu Jayawardhana <tharindu.rti@gmail.com>

සී. ඩී. වික්‍රමරත්න,
පොලිස්පති,
නම් කළ නිලධාරී,

1. අයදුම් කරුගේ නම - තරිඳු ජයවර්ධන, සමාජය හා සාමයික කේන්ද්‍රය

2. ලිපිනය - 281, ඩීන්ස් පාර, කොළඹ 10

3. දුරකථන අංකය (තිබේනම්) - 071-0661417

4. විද්‍යුත් ලිපිනය(තිබේනම්) - csr.rti281@gmail.com

5. තොරතුරු ඉල්ලීම කළ දිනය : 17.07.2022

6. තොරතුරු නිලධාරියාගේ නම : තොරතුරු නිලධාරී, පොලිස් සැපයුම් කොට්ඨාශය

7. තොරතුරු නිලධාරී වෙත තොරතුරු අයදුම්පත යොමු කරන ලද විද්‍යුත් ලිපින : dir.supplies@police.lk

8. තොරතුරු නිලධාරියාගෙන් පිළිතුරු ලැබුණේද? නැත

9. අභියාචනය පදනම් කරගත් හේතුව :- මේ පනත මඟින් නිශ්චිතව දක්වා ඇති කාල සීමාවන්ට අනුකූල නොවීම

10. ඉල්ලා සිටින තොරතුරු පිළිබඳ විස්තර පහත පරිදි වේ.
2010 ජනවාරි 1 වන දින සිට 2022 ජනවාරි 1 වන දක්වා කාලය තුළ,

1) ලංකාවට ගෙන්වා ඇති ක දුළු ගෑස් ප්‍රමාණය කොපමණද?

2) ලංකාවට අවස්ථා කීයකදී කඳුළු ගෑස් ගෙන්වා තිබේද?

4) එම එක් එක් අවස්ථාවේදී වියදම් වූ මුදල් ප්‍රමාණයන් වෙන් වෙන්ව කොපමණක් ද?

5) එලෙස කඳුළු ගෑස් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දුන් ලේඛන මොනවාද? එලෙස කඳුළු ගෑස් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවූ ලේඛන වල සහතික පිටපත් ලබා දෙන්න.

6) එම සෑම අවස්ථාවකටම අදාළ තාක්ෂණික ඇගයුම් කමිටු වාර්තා වල සහතික පිටපත් ලබා දෙන්න.

7) එම සෑම අවස්ථාවකටම අදාළ ටෙන්ඩර් ප්‍රධානය කළ ලිපි වල සහතික පිටපත් ලබා දෙන්න.

8) මෙම තොරතුරු ඉල්ලීමට පාදක වන කාලසීමාවේදී කඳුළුගෑස් භාවිත කළ ප්‍රමාණය වාර්ෂිකව ලබා දෙන්න.

9) පසුගිය දිනවල කල් ඉකුත් වූ කඳුළු ගෑස් පොමණ ප්‍රවමාණයක් භාවිත කළේද?

10) එලෙස භාවිත කිරීමට හේතුව කුමක්ද?

11) කල් ඉකුත් වූ කඳුළු ගෑස් භාවිත කිරීමට අවසර ගත්තේ කාගෙන්ද? ඊට අදාල ලේඛණවල සහතික පිටපත් ලබා දෙන්න.

12) 2022 මාර්තු 31 සිට 2022 ජූලි 17 තෙක් කඳුළු ගෑස් ප්‍රහාර අවස්ථා කොපමණ ප්‍රමාණයකදී එල්ල කර තිබේද?

13) එලෙස එල්ල කළ අවස්ථාවලදී භාවිත කරන ලද කඳුළු ගෑස් ප්‍රමාණයන් මොනවාද? ඒ බව සඳහන්වන ලේඛනවල සහතික පිටපත් ලබා දෙන්න.

14) එම අවස්ථාවලදී භාවිත කළ කඳුළු ගෑස් කුමන වසරවල මිලදී ගත් කඳුළු ගෑස්ද? ඊට අදාල සියලු ලේඛනවල සහතික පිටපත් ලබා දෙන්න.

11. වෙනත් හේතු: මේ දින වල පැවැත්වෙන උද්ඝෝෂණයන්හී උද්ඝෝෂකයන් සඳහා දිගින් දිගටම කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීම හරහා ඔවුන්ට විවිධ ශාරීරික හානි ඇතිව ඇති අතර එකී කඳුළු ගෑස් හී ප්‍රමිතිය සම්බන්ධයෙන් සමාජය තුළ කතිකාවතක් ගොඩනැඟී ඇත.දිනෙන් දින රට තුල උද්ඝෝෂණ වැඩියෙන් ක්‍රියාත්මක වන තත්ත්වය හමුවේ පුරවැසියන්ගේ ජීවිතය සහ පුද්ගලික නිදහස ආරක්ෂා කර ගැනීමට අතිශයින්ම මෙම තොරතුරු වැදගත් වේ.

ඊමේල් මගින් තොරතුරු ලබා දෙන ලෙස ඉල්ලා සිටිමු.